# <u>බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව</u>

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2008.11.27

වේලාව : පෙ.ව.11.00

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී. විරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

<u>සහභාගීත්වය:-</u>

01. ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී. විරසිංහ මැතිතුමා
02. ගරු උපසභාපති - සුමේද චමින්ද බස්නායක මැතිතුමා
03. ගරු නගර සභා මන්ත්‍රී- ධර්මසේන සමරසිංහ මැතිතුමා.
04. ගරු නගර සභා මන්ත්‍රී- ඊ.ජී.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
05. ගරු නගර සභා මන්ත්‍රී- ඩබ්.ජී. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
06. ගරු නගර සභා මන්ත්‍රී- එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
07. ගරු නගර සභා මන්ත්‍රී- එම්.ටී.එම්. රූමි මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී - යූ.එච්.ගාමිණී මැතිතුමා
09. ගරු නගර සභා මන්ත්‍රී- විමලසේන වැවේගෙදර මැතිතුමා.

<u>නිලධාරී සහභාගීත්වය:-</u>

01. නාගරික ලේකම් - ආර්.ඩී. නලින් පුෂ්පකුමාර මහතා

(01) <u>ආගම සිහිකිරීම:</u>

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) <u>ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:</u>

ගරු සභාපතිතුමා කථා කරමින්, අද දින පැවැත්වෙන සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින, ගරු උපසභාපතිතුමා, නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමා හා පුවත්පත්කලාවේදී මහතා සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන් පැවසීය.

ගරු සභාපතිතුමා කථා කරමින්, මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික පිළිසරු ව්‍යාපෘතිය යටතේ මිලියන 7.8 ක මුදලක් මෙම සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබුණු බවත්, එම මුල්‍ය ප්‍රතිපාදන උපයෝගි කරගෙන අඩි 220 ක් දිග, අඩි 70 ක් පළල ගොඩනැගිල්ලක් සහ අඩි 70 ක් පළල, අඩි 300 ක් දිග බිමක් කොන්ක්‍රීට් කිරීමේ කාර්යය ආරම්භ කරනු ලැබූ අතර, මේ වන විට එම කර්මාන්තයේ වැඩ 40% ක් පමණ නිම කර තිබෙන බව දැන්විය.

අතිගරු ජනාධිපතිතුමාගේ තෙවර්ෂ පූර්ණ පදවි ප්‍රාප්තිය නිමිතිකරගෙන ගම නැගුම වැඩ සටහන යටතේ බලන්ගොඩ නගර සභා බලප්‍රදේශය තුළ ඉටු කල කර්මාන්ත 03 ක් පසුගිය දා ජනතා අයිතියට පැවරූ බව සතුටින් යුතුව ප්‍රකාශ කරන බව සඳහන් කරමින්, සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට ලේකම් මහතාට ආරාධනය කරන ලදී.

(03). **<u>2008.10.30 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:</u>**

පසුගිය සභා වාර්තාවේ 13:02 වෙනත් කරුණු යන ශිර්ෂය යටතේ තමන් කල කථාවේ "කිරිදිගල ජයන්ති ලිඳ පාර ඉතා අබලන් වී ජනතාවට ගමන් කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින්, එම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටින ලදි."

යනුවෙන් සඳහන්ව ඇති බවත්, එම කොටස "කිරිදිගල ලිඳ පාර ඉතා අබලන් වී ජනතාවට ගමන් කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින්, එම මාර්ගය සංවර්ධනය කරදෙන ලෙස ඉල්ලා සිටින ලදි." යනුවෙන් සංශෝධනය විය යුතු බව ගරු නගර සභා මාන්ත්‍රි ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් දන්වන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා කථා කරමින්, සභා වාර්තාවේ 13:03 වෙනත් කරුණු යන ශිර්ෂය යටතේ තමන් කල ප්‍රකාශයේ "බලන්ගොඩ ජාතික පාසලේ 11 වසරේ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු විසින් අංග සම්පූර්ණ හා කාර්යක්ෂම තැපැල් යන්ත්‍රයක් නිපදවා ඇති බවත්, රටවල් 854 කින් මෙම සිසුවාගේ නිර්මාණය 06 ස්ථානයට තේරීපත්ව ඇති බවත්," යන කොටස "බලන්ගොඩ ජාතික පාසලේ 11 වසරේ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු විසින් අංග සම්පූර්ණ හා කාර්යක්ෂම තැපැල් යන්ත්‍රයක් නිපදවා ඇති බවත්, පාසල් 854 කින් මෙම සිසුවාගේ නිර්මාණය 06 ස්ථානයට තේරීපත්ව ඇති බවත්," යනුවෙන් සංශෝධනය විය යුතු බව දැන්විය. එම සංශෝධනයන්ට යටත්ව
2008.10.30 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී එම්.ජේ.එම්.ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **<u>පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:</u>**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවිය.

05. **<u>සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම</u>**

05:01 **<u>පොදු වෙළඳසල කඩ කාමරවල කුළිය වැඩිකිරීම:</u>**
උක්ත කරුණට අදාළව ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පොදු වෙළඳසල හා මැණික් කඩ කාමර වල කඩකුළිය රු.1500/- කින් වැඩිකිරීමට 2008.11.14 දින පැවැති සාකච්ඡාවේ දී තිරණය කරනු ලැබුවද , මෙවැනි මුදලක් ගෙවීම අපහසු බැවින්, සාධාරණ මුදලක් අයකරන ලෙස කඩහිමියන් විසින් ඉල්ලීමක් කර ඇති බව එමගින් වාර්තා කර තිබුණ.

මේ සම්බන්ධව සාකච්ජා කල සභාව, රු.1000/- ක කඩ කුළියක් මාසිකව අයකිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:02 **<u>පොදු කාණුවක් උඩ කඩ කාමරයක් සකස් කිරීම:</u>**

උක්ත කරුණට අදාළව ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.
කතරගම දේවාලයට යාබඳ පිහිටි කාණුව උඩ අඩි 4 පමණ පළලකින් යුක්තව කඩ කාමරයක් සකස් කර ඇති බවත්, මෙය පොදු කාණුවක් බැවින්, බලන්ගොඩ නගර සභාව නමින් මෙය ලේඛණගත කර ගොඩනැගිල්ල ඉදිකල අයගෙන් මාසිකව බද්දක් අයකිරීම හෝ එසේ නොමැති නම් මෙම දේපල සභාව වෙත පවරා ගැනිම සුදුසු බව දන්වා තිබිණ.

මෙය සභාව වෙත පවරා ගැනිමට තීරණය කරන ලදී.

### 05:03 බළන්ගොඩ බස්නැවතුම්පල අංක: සී 43 දරණ කඩ කාමරය:

බළන්ගොඩ බස්නැවතුම්පල අංක: සී 43 දරණ කඩ කාමරය කුලී පදනම මත කරුණාවතී යන අයට බදු ලබා දී තිබුණු බවත්, ඇයට එම කඩ කාමරය පවත්වාගෙන යාමට නොහැකි බැවින්, එම කඩ කාමරය සුජීව උපුල් යන අය පවරා දෙන ලෙස ඉල්ලා ඇති බව ආදායම් අංශයෙන් වාර්තා කර තිබුණි.

මේ පිළිබඳව සාකච්ඡා කල සභාව, සී.43 දරණ කඩ කාමරයේ බදු අයිතිය සුජීව උපුල් යන අයගේ නමට සංශෝධනය කිරීමටත්, ඔහුගේ නමින් බදුකුලී අයකිරීමටත් තීරණය කරන ලදි.

### 05:04 වන්නි හමුදා මෙහෙයුම් වල නිරත රණවිරුවන් හට ද්‍රව්‍යමය ආධාර සැපයීම.

උක්ත කරුණට අදාළව, සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් විසින් එවා තිබූ 2008.11.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

එමගින් ඉහත කරුණට අදාළ රැස්වීමක් 2008.11.18 වන දින ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් සභා ශ්‍රවණාගාරයේ දී පැවැත්වෙන බව දන්වා තිබුණු බවත්, එ අනුව මෙම සභාවේ වැඩ අධිකාරී මහතා එම රැස්වීමට සහභාගී කර වූ අතර, එහිදී ආයතනික මට්ටමින් ලීටර් 500 ජල බඳුන් හා කෙටි ආහාර ද , සභා අරමුදලින් රු.50,000/- ක මුදලක් දැරීමට ද යෝජනා වූ බව ඒ මහතා සභාව වෙත වාර්තා කර ඇති බව ලේකම් මහතා දැණුම් දෙන ලදී.

ඒ අනුව, සභා අරමුදලින් රු.50,000/- ක මුදලක් සබරගමුව පළාත් සභාවේ ගරු පළාත් පාලන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව ගෙවීම සුදුසු බවට තීරණය කරන ලදි.

### 05:05 2009 වර්ෂය සඳහා කසල එකතු කිරීමේ සේවාව සඳහා කම්කරුවන් යෙදවීම ටෙන්ඩර් කිරීම:

සෞඛ්‍ය අංශයේ අනුමත සෞඛ්‍ය කම්කරුවන් ප්‍රමාණයක් නොමැති නිසා, කසල ඉවත කිරීමේ සේවාව නියමිත පරිදි කරගෙන යාමට අපහසු වී ඇති බැවින්, , කසල එකතු කිරීම, විථි අතුගෑම, බස්නැවතුම්පොල පිරිසිදු කිරීම, විථි වල වැලි ඉවත් කිරීම කාර්යයන් ඉටුකරගැනීම සඳහා නගර සභාවේ රියදුරන් ,ඉන්ධන සමඟ ලබාදීමේ කොන්දේසියට යටත්ව මෙම සේවාව ටෙන්ඩර් කිරීම සුදුසු බව දන්වමින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ටෙන්ඩර් කිරීමේ දී පහත කරුණු කෙරෙහි ද සභාවේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා තිබෙන බව ලේකම් මහතා සභාව වෙත පැහැදිලි කරන ලදී.

01. අවම වශයෙන් කසල එකතු කිරීමට කම්කරුවන් 10 ක් ද, අතුගෑම සඳහා සඳහා කම්කරුවන් දෙදෙනෙක් ද යෙදවිය යුතුය.

02. බස්නැවතුම්පොළ සඳහා දිවාකාලයට ට්‍රැක්ටර් රථ 02 ක් රාත්‍රී හා කාලයට ට්‍රැක්ටර් රථ 03 ක් යෙදවිය යුතුය.

03. උපරිම ලංසුව මාසිකව රු.175000/- ක් විය යුතු අතර, වැට් බද්ද පිළිබඳව තීරණයක් ගත යුතුය.

උපරිම මාසිකව ලංසුව රු.175,000/- ලෙස සලකා ටෙන්ඩර් කැඳවීම සුදුසු බවටත් ටෙන්ඩර් විවෘත කිරීම 2008.12.17 පෙ.ව.11.00 ට සිදුකිරීමටත් තිරණය කල සභාව, පුවත්පත් දැන්වීමක් මගින් මෙය ප්‍රසිද්ධ කිරීමට වැඩිදුරටත් තිරණය කරන ලදී.

05:06 **පොදු වැසිකිලියේ නඩත්තු කටයුතු ටෙන්ඩර් කිරීම:**

2009.01.01 දින සිට 2009.12.31 දක්වා කාලයට බළන්ගොඩ පොදු වැසිකිලියේ නඩත්තු හා පිරිසිදු කිරීම ටෙන්ඩර් කිරීම සුදුසු බව යෝජනා කරමින්, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, මෙම සේවාව පවත්වාගෙන යාම සඳහා ද ටෙන්ඩර් කැඳවීම සුදුසු බවත්, පුවත්පත් දැන්වීමක් මගින් මෙය ප්‍රසිද්ධියට පත්කර 2008.12.17 වන දින පෙ.ව.11.00 ට ටෙන්ඩර් විවෘත කිරීම සුදුසු බවටත් තිරණය කරන ලදී.

05:07 **15 වැනි ආසියානු ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා උළෙල නියෝජනය කිරීමට අවශ්‍ය මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාගැනීම.**

උක්ත කරුණට අදාළව බලන්ගොඩ, උඩවෙල, මොරහැල ඩබ්.එන්. වෙහෙරගොඩ යන අය විසින් එවා ඇති 2008.10.01 දිනැති ලිපිය සභාගත කරන ලදි.

2008 දෙසැම්බර් 01-05 දිනයන් හි තායිලන්තයේ චෙයින් මායි( Chaung Mai ) හි පැවැත්වෙන 15 වන ආසියානු ප්‍රවීනයන්ගේ මළල ක්‍රීඩා උළෙලේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට තමා සුදුසුකම් ලබා ඇති බවත්, මේ සඳහා මළල ක්‍රීඩා සංගමයෙන් මූල්‍ය අනුග්‍රාහකත්වයක් නොලැබෙන බැවින්, සියළු වියහියදම් පියවාගත යුත්තේ තමන් විසින්ම වන නිසා, යම් කිසි මූල්‍ය අනුග්‍රාහකත්වයක් ලබාදීමට මැදිහත්වන ලෙස ඉල්ලා තිබුණ.

සභාව විශාල මූල්‍ය අර්බුදයකට ලක්වී සිටින බැවින්, මූල්‍යමය ආධාරයක් කල නොහැකි බව දන්වා යැවීමට තිරණය කරන ලදී.

05:08 **වැය ශීර්ෂ මාරු කිරීම:**

මුදල් ඉතිරිව ඇති වැය ශීර්ෂ වලින් මුදල් අවශ්‍ය වැය ශීර්ෂ වලට මුදල් මාරු කිරීමට සභාවේ අනුමැතිය ඉල්ලමින් ප්‍රධාන කළමණාකරණ සහකාර මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

| ප්‍රතිපාදන අවශ්‍ය වැය ශීර්ෂය | විස්තරය | මුදල | ප්‍රතිපාදන ඉතිරි වැය ශීර්ෂය | විස්තරය | ඉතිරි මුදල |
|---|---|---|---|---|---|
| 1.1.411 | වැටුප් හා වේතන | 600000.00 | 1.1.412 | අතිකාල | 225000.00 |
| | | | 1.1.418 | සතික දීමනා | 300000.00 |
| | | | 1.1.421 | ගමන් වියදම් | 40000.00 |
| | | | 1.1.422 | ගමන් වියදම් | 10000.00 |
| | | | 1.1.429 | ගමන් වියදම් | 25000.00 |
| | | 600000.00 | | | 600000.00 |
| 1.3.416 | දීමනා | 2000.00 | 1.2.421 | ගමන් වියදම් | 2000.00 |
| 1.3.455 | දේපල | 30000.00 | 1.3.412 | අතිකාල | 25000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තහනම් කිරීමේ දීමනා | | | | |
| | | | 1.3.437 | නිල ඇඳුම් | 5000.00 |
| | | 30000.00 | | | 30000.00 |
| 1.3.419 | වෙනත් | 25000.00 | 1.1.488 | වැ.අ.වි.වැ | 15000.00 |
| | | | 1.2.412 | අතිකාල | 5000.00 |
| | | | 1.4.412 | අතිකාල | 5000.00 |
| | | 25000.00 | | | 25000.00 |
| 2.3.416 | දීමනා | 30000.00 | 1.4.411 | වැටුප් | 15000.00 |
| | | | 2.5.437 | නිල ඇඳුම් | 15000.00 |
| | | 30000.00 | | | 30000.00 |
| 2.5.412 | අතිකාල | 50000.00 | 2.1.416 | දීමනා | 40000.00 |
| | | | 2.1.437 | නිල ඇඳුම් | 10000.00 |
| | | 50000.00 | | | 50000.00 |
| 6.6.416 | දීමනා | 35000.00 | 2.1.412 | අතිකාල | 25000.00 |
| | | | 2.3.421 | ගමන් වියදම් | 10000.00 |
| | | 35000.00 | | | 35000.00 |
| 3.3.421 | ගමන් වියදම් | 25000.00 | 2.5.441 | වාහන හා යන්ත්‍ර සූත්‍ර | 25000.00 |
| 1.1.432 | ඉන්ධන | 150000.00 | 1.1.441 | අලුත්වැඩියා හා නඩත්තු | 100000.00 |
| | | | 6.2.416 | පී.වි.දීමනා | 50000.00 |
| | | 150000.00 | | | 150000.00 |
| 2.9.411 | වැටුප් | 4000000.00 | 1.2.411 | වැටුප් | 700000.00 |
| | | | 1.2.416 | දීමනා | 90000.00 |
| | | | 2.1.411 | වැටුප් | 425000.00 |
| | | | 2.5.416 | දීමනා | 420000.00 |
| | | | 6.2.411 | වැටුප් | 350000.00 |
| | | | 6.4.411 | වැටුප් | 344000.00 |
| | | | 6.4.416 | දීමනා | 64500.00 |
| | | | 3.1.411 | වැටුප් | 160000.00 |
| | | | 3.4.411 | වැටුප් | 900000.00 |
| | | | 3.3.442 | නඩත්තු | 500000.00 |
| | | | 5.2.412 | වැටුප් | 50000.00 |
| | | 4000000.00 | | | 4000000.00 |
| 3.4.442 | නඩත්තු | 700000.00 | 6.5.473 | ළදරු පාසල් පාලිකා දීමනා | 150000.00 |
| | | | 6.2.512 | පොත් මිළදී ගැනීම | 50000.00 |
| | | | 3.3.412 | අතිකාල | 90000.00 |
| | | | 3.3.441 | නඩත්තු | 200000.00 |
| | | | 3.4.441 | නඩත්තු | 50000.00 |
| | | | 5.2.441 | පළාත් පාලන සතිය | 100000.00 |
| | | | 6.5.475 | නඩත්තු | 45000.00 |
| | | | 6.2.442 | | 10000.00 |
| | | 700000.00 | | | 700000.00 |
| 5.2.442 | නඩත්තු | 300000.00 | 3.4.416 | දීමනා | 230000.00 |
| | | | 3.4.412 | අතිකාල | 30000.00 |
| | | | 3.1.412 | අතිකාල | 25000.00 |
| | | | 3.1.437 | නිල ඇඳුම් | 10000.00 |
| | | | 3.3.437 | නිල ඇඳුම් | 7000.00 |
| | | 300000.00 | | | 300000.00 |

05:09 **විශ්ව විද්‍යාල ශිෂ්‍යාධාර:**

බළන්ගොඩ කිරිඳිගල අංක:310/6 දරණ ලිපිනයේ පදිංචි එච්.ජී.ටී. පියුමාලි ශිෂ්‍යාව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ඉගෙනීම් කටයුතු කරන බවත්, ඇයට මෙම නගර සභාවෙන් ශිෂ්‍යාධාරයක් ලබාදීම සුදුසු බව සඳහන් කරමින් ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එවා ඇති 2008.11.25 දිනැති ලිපිය සභාගත කරන ලදුව, 2006/2007/2007/2008 විශ්ව විද්‍යාල සඳහා ප්‍රවේශවීමට සුදුසුකම්ලත් අයගෙන් පමණක් විස්තර ලබාගැනීමට තිරණය කරන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම:** ( රු.10000/- ට වැඩි ගෙවීම් )

2008.10.31 දින සිට 2008.11.25 දින දක්වා ගෙවන ලද රු.10000/- ට වැඩි ගෙවීම් පිළිබඳ විස්තරයක් සභාවට ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| 01. | දේශිය ආදායම් කොමසාරිස් -වැට් බදු<br>2008.09.01 සිට 2008.09.30 දක්වා<br>කාලය තුළ එකතු කල අගය මත බදු<br>ගණනය කිරීම | රු.157904.00 |
| 02. | සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා<br>2008.10.07 සිට 2008.10.15 දක්වා ඉන්ධන<br>බිල පියවීම. | රු. 106011.40 |
| 03. | ජාතික ජල සම්පාද මණ්ඩලය<br>2008 ඔක්තෝබර් මස ජල බිල පියවීම<br>පො.වෙ.සැ. - 14340.50<br>පිංතාලිය - 333.50 | රු. 14674.00 |
| 04. | සාමාන්‍යාධිකාරී,ලංකා විදුලිබල මණ්ඩලය<br>2008 සැප්තැම්බර් මස විදුලිය බිල<br>පො.වෙ.සැල - 10906.50<br>ප්‍රේක්ෂකාගාරය 532.50 | රු. 11439.00 |
| 05. | සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය<br>2008 සැප්තැම්බර් මස විදුලිය බිල<br>කාර්යාලය | රු. 15976.50 |
| 06. | බී. ගුණරත්න මයා<br>2008.10.06 සිට 2008.10.31 කසළ ප්‍රවාහනය<br>කිරීමට සේවකයින් යෙදවීම. | රු. 86500.00 |
| 07. | ඊ.ජී. චන්ද්‍රරත්න<br>ඝන අපද්‍රව්‍ය ම්‍යස්ථානයේ පොහොර 15000 කි.ග්‍රෑ.<br>හැලිම සඳහා | රු. 15000.00 |
| 08. | දේශිය ආදායම් කොමසාරිස්<br>2008.09.01 සිට 2008.09.30 දක්වා එකතු කරන<br>ලද මුද්දර බදු අයකිරීම. | රු. 14220.00 |
| 09. | කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>වැලිහරනාව අතුර මාර්ගය කොන්ක්‍රීට් කර<br>සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | රු. 355214.03 |
| 10. | කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය<br>තුඹගොඩ කෝපිවත්ත රණවිලවත්ත මාර්ගය<br>කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම. | රු.371137.27 |

| | | |
|---|---|---|
| 11. | කළමණාකරු, සමෘද්ධි බැංකු සංගමය<br>කරව්කැටිය ගල්වල පාර කොන්ක්‍රිට් කර සංවර්ධනය<br>කිරීම කර්මාන්තයේ අවසන් කොටස ගෙවීම<br>එම මුදලින් 50% ගෙවීම. | රු. 277047.78 |
| 12. | වැකර් ඉලෙක්ට්‍රිකල්ස්<br>විථි පහන් අලුත්වැඩියා සඳහා ද්‍රව්‍ය ලබාගැනීම | රු. 143854.09 |
| 13. | සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය<br>2008 ඔක්තෝබර් මස විදුලිය බිල පියවීම. | රු. 14065.50 |
| 14. | ජයන්ති ටයර් සෙන්ටර්<br>එන්ඩී.5124 ටොයෝටා වෑන් රථයට 215-7515<br>ප්‍රමාණයේ බ්‍රිජස්ටෝන් ටයර් 02 මිළදී ගැනීම. | රු. 31284.00 |
| 15. | සෙනෙවිරත්න ස්ටෝර්ස්<br>තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා පුටු<br>04 හා කියවීම් ශාලාව සඳහා ප්ලාස්ටික්<br>පුටු 24 ක් මිළදී ගැනීම. | රු. 27541.80 |
| 16. | ජ්.ජ්. එරත්න අමුණුමුල්ල<br>67-1565 ට්‍රේලරයේ දිරාගිය කොටස් පාස්සා<br>අලුත්වැඩියා කිරීම හා හිච්කොක්ක හා හිච් එක<br>පිරවීම වෙනුවෙන් මුදල් ගෙවීම. | රු. 12150.00 |
| 17. | සාමාන්‍යාධිකාරී, ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර<br>සමිතිය.<br>2008.10.15 සිට 2008.10.24 දක්වා ඉන්ධන බිල<br>පියවීම. | රු. 112150.80 |
| 18. | බ.න.ස. නාගරික සංවර්ධනය පිළිබඳ ගිණුම<br>2008.01.01 සිට 2008.07.31 දක්වා පෙර සැරි<br>ගාස්තු තැන්පත් පොදු ගිණුමට ගැනීම. | රු. 55060.00 |
| | සාමාන්‍යාධිකාරී, ලංකා වි.බ.ම.<br>2008 ඔක්තෝබර් මස විදුලි බිල<br>පො.වෙ.සැල - 10653.00<br>ප්‍රේක්ෂකාගාරය 532.50 | රු. 11185.50 |
| 19. | නිහාල් ට්‍රේඩින් කොම්පැණි<br>නව තොරතුරු මධ්‍යස්ථානය හා කියවීම්<br>ශාලාව තින්ත ආලේපය කිරීම. | රු. 163523.29 |
| 20. | ජනශක්ති හාඩ්වෙයාර්<br>කම්බි ( යකඩ ) ලබාගැනීම වෙනුවෙන් | රු. 765512.55 |
| 21. | බී. ගුණරත්න<br>2008.11.01 දින සිට 2008.11.31 දක්වා කසල<br>ප්‍රවාහනය කිරීම සඳහා කම්කරුවන් යෙදවීම. | රු. 88500.00 |
| 22. | එම්.ජී. පියසේන<br>පෞද්ගලික බස්ගාල් ගාස්තු වලින් තැන්පත් ආපසු<br>ගෙවීම. | රු. 21750.00 |
| 23. | ලහිර් සන්ස්<br>බූට්ස්,ග්ලවුස්,මාක්ස් මිළදී ගැනීම වෙනුවෙන් | රු. 60799.20 |

24. ඉඹුල්පේ විවිධ සේවා සමිතිය
2008.10.27 සිට 2008.10.31 දක්වා ඉන්ධන
බිල පියවීම. රු. 68302.40

25. ඊ.ජී.චන්ද්‍රරත්න
කොම්පොස්ට් පොහොර 15000 කි.ග්‍රෑ හැලීම
සඳහා ගාස්තු රු. 15000.00

26. කළමණාකරු,
සමෘද්ධි බැංකු සංගමය
ආනන්ද මෛත්‍රිය මාවත සිට සුදර්ශනගම
1 පටුමග සම්බන්ධ පාර කොන්ක්‍රීට් කිරීම
කර්මාන්තයේ අවසන් ගෙවීම. රු.45665.00

මෙම මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදී.

07. <u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම:</u>

ඇස්තමේන්තු කිසිවක් ඉදිරිපත් නොවිය.

08.1 <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ</u> : නැත

11. <u>යථා පරිදි කල් දී ඇති යෝජනා:</u> නැත

09. <u>ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම</u>:
මෙම නගර සභාව සතු පොදු වෙළඳසල අංක: 16 එළහරක් මස්කඩය/ අංක:15 එළුමස් කඩය/ අංක: 17 කුකුළු මස් කඩය 2009.01.01 දින සිට 2009.12.31 දින දක්වා කාලයට බදුදීම සඳහා කැඳවන ලද ලංසු විවෘත කිරීම පෙ.ව.11.30 ට සිදුකරන ලදී.

**<u>අංක: 16 එළහරක් මස් කඩය:</u>**

| ලංසුකරුගේ නම | ලංසු මුදල |
|---|---|
| 01. ඩී.එම්.එම්.ෆලීල් මහතා, අංක:260, මිරිස්වත්ත ,බලන්ගොඩ | රු.1500400.00 |

අංක: 16 එළහරක් මස් කඩය සඳහා ලංසු පෝරම එකක් පමණක් නිකුත් වී තිබුණු අතර, ඒ සඳහා ඩී.එම්.එම්.ෆලීල් මහතා විසින් රු.1500400/- ක මිළ ගණනක් ඉදිරිපත් කර තිබුණු අතර, එම මිළ ගනන් පිළිගත් සභාව, 2009.01.01 දින සිට 2009.12.31 දින දක්වා කාලයට එම කඩ කාමරය ඔහු වෙත බදුදීමට තිරණය කරන ලදී.

**<u>අංක: 15 එළුමස් කඩය:</u>**

| ලංසුකරුගේ නම | ලංසු මුදල |
|---|---|
| 01. එම්.ආර්.එම්. ඉම්රාන් මයා අංක:260, මිරිස්වත්ත ,බලන්ගොඩ | රු.75175.00 |

අංක:15 එළු මස් කඩය සඳහා ලංසු පෝරම එකක් පමණක් නිකුත් වී තිබුණු අතර, ඒ සඳහා එම්.ආර්.එම්. ඉම්රාන් බෂරි මහතා විසින් රු.75175/- ක මිළ ගණනක් ඉදිරිපත් කර තිබුණු අතර, එම මිළ ගනන් පිළිගත් සභාව, 2009.01.01 දින සිට 2009.12.31 දින දක්වා කාලයට එම කඩ කාමරය ඔහු වෙත බදුදීමට තිරණය කරන ලදී.

අංක: 17 කුකුළු මස් කඩය:

ඩී.එම්.එම්. යාසින් මයා
කහටපිටිය හංදිය, මිරිස්වත්ත,බලන්ගොඩ රු.196750.00

අංක:17 කුකුළු මස් කඩය සදහා ලංසු පෝරම එකක් පමණක් නිකුත් වී තිබුණු අතර, ඒ සදහා ඩී.එම්.එම්. යාසින් මහතා විසින් රු.196750/- ක මිළ ගණනක් ඉදිරිපත් කර තිබුණු අතර, එම මිළ ගනන් පිළිගත් සභාව, 2009.01.01 දින සිට 2009.12.31 දින දක්වා කාලයට එම කඩ කාමරය ඔහු වෙත බදුදීමට තීරණය කරන ලදී.

10. යෝජනා

නැත

11. කාරක සභා වල වාර්තා සලකා බැලීම:

- 2008.10.01 සිට 2008.10.31 දක්වා මෙම සභාව සතු වාහන සදහා වැය වූ ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් එය සම්මත කරන ලදී.

12. ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරීම:

12:01 2008 ඔක්තෝබර් මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්තන ගෙවීම් | 2699633.90 |
| වෙනත් ගෙවීම් | 1305532.94 |
| | ----------- |
| මුළු ගෙවීම් | 4005166.84 |
| | ======== |
| ලැබීම්-2008 ඔක්තෝබර් | |
| පුනරාවර්ථන ලැබීම් | 3137594.36 |
| වෙනත් ලැබීම් | 637523.36 |
| | ---------- |
| මුළු ලැබීම් | 3775117.72 |
| | ======== |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

12:02 සංශෝධිත අයවැය කෙටුම්පත ඉදිරිපත් කිරීම:

2009 අයවැය යෝජනාවේ දී රාජ්‍ය සේවකයින් සදහා ජී.වි.දි.රු.1000/- කින් වැඩිකිරීම හේතුකොටගෙන පසුගිය සභාවාරයේ දී සම්මත කරන ලද අයවැය කෙටුම්පත සංශෝධනය කර සභාවේ අනුමැතිය සදහා ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| 2009 ඇස්තමේන්තුගත පුනරාවර්ථන ආදායම | 48,422.500.00 |
| පුනරාවර්ථන වියදම | 40,357.500.00 |
| අතිරික්තය | 8,065.000.00 |

අඩුකලා:

| | |
|---|---|
| පුස්තකාල පොත් මිළදි ගැනිම | 200,000.00 |
| දේශිය ණය හා සංවර්ධන අරමුදල(ණය වාරික) | 15,597,000.00 |
| | ------------ |
| එකතුව | 15,797,000.00 |
| | ========== |
| ඌණතාවය | ( 7,732,000.00) |

මෙම අයවැය කෙටුම්පත සහා සම්මත කිරීමට  ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

13. **වෙනත් කරුණු:-**

## 13:01 ගරු නගර සභා මන්ත්‍රී,ධර්මසේන සමරසිංහ මැතිතුමා:

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්, අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩපිළිවෙල අර්ථවත් කරමින්, පේෂකර්ම අමාත්‍යාංශය මගින් ජීවනෝපාය සංවර්ධන වැඩ සටහන යටතේ කුමාරගම ප්‍රදේශයේ අත්යන්ත්‍ර පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් මෙම මස 24 වන දින ජනතා අයිතියට පැවරූ බව දැන්විය. අපේ රටේ අඩපණ වී යන ජාතික කර්මාන්ත නහා සිටුවීම සඳහා පේෂකර්ම අමාත්‍යාංශය විසින් මෙවැනි වැඩ සටහන් ක්‍රියාවට නංවා තිබීම ඉතා අගය කලයුතු වන බව දැන් වූ ගරු මන්ත්‍රීතුමා, ගරු පේෂකර්ම අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමාගේ අමාත්‍යාංශ ප්‍රතිපාදන මත තමාගේ යෝජනාවකට අනුව ඉහත සඳහන් පුහුණු මධ්‍යස්ථානය ගරු පේෂකර්ම අමාත්‍ය . මහින්ද රත්නතිලක මැතිතුමා හා වාරි මාර්ග ගරු අමාත්‍ය ජයතිස්ස රණවීර මැතිතුමන් අතින් ජනතා අයිතියට පැවරීමට හැකිවීම තමා ලද භාග්‍යයක් කොට සලකන බව දැන්විය. මෙගින් මෙම ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන්ට විශාල සේවාවක් සැලසෙන බව සඳහන් කල එතුමා, මෙය ජනතා අයිතියට පැවරීමේ දිනය ඉතා හදිසියේ නියම කරගත් නිසා ඒ පිළිබඳව නිසි සංනිවේදනයක් ලබාදීමට නොහැකි වූ බවත්, නමුත්, තමා මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන්ගේ නිවෙස් වලට ගොස් මෙම අවස්ථාවට සහභාගීවන ලෙස ආරාධනය කලද ගරු මන්ත්‍රීවරුන් ඒ සඳහා සහභාගි නොවූ බවත් ඒ පිළිබඳව තමාගේ කණගාටුව ප්‍රකාශ කරන බවත් දැන්විය. කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ දී කණ්ඩායම් හැඟීමෙන් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කල ගරුමන්ත්‍රීතුමා, 2008.11.25 වන දින දිවයින පුවත්පතේ කිරිදිගල මැද පාර සංවර්ධනය කරදෙන ලෙස කර ඇති ඉල්ලීම කෙරෙහි අවධානය යොමු කර එම මාර්ගය සකස් කරදෙන ලෙස  ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව සඳහන් කරමින් සිය කථාව අවසන් කරන ලදි.

## 13:02 ගරු නගර සභා මන්ත්‍රී,එම්.ටී.එම්. රූමි මැතිතුමා:

ගරු මන්ත්‍රීතුමා කථාකරමින්, තමාට පාසලේ අත්‍යාවශ්‍ය රාජකාරී කටයුත්තක් යෙදී තිබුණු නිසා, ගරු මන්ත්‍රීතුමා ඉහත සඳහන් කල උත්සව අවස්ථාවට සහභාගිවීමට නොහැකි වූ බවත්, පළමුවෙන්ම ඒ සම්බන්ධව සමාව අයැද සිටින බවත්  දැන්විය.

අතිගරු ජනාධිපතිතුමාගේ 63 වන උපන් දිනයට සුභ පැතුම් එක් කල ගරු මන්ත්‍රීතුමා, අතිගරු ජනාධිපතිතුමා ජනාධිපති තනතුරට පත්ව  වසර තුනක් ගෙවී ගිය මෙම අවස්ථාවේ එතුමාටත්, රජයටත්, ආරක්ෂක අංශයටත් සුභ ප්‍රාර්ථනය කල ගරු මන්ත්‍රීතුමා, අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වූ දා සිට උතුරේ මානුෂික මෙහෙයුම් ක්‍රියාත්මක කරමින් සියලු ශ්‍රී ලාංකික පුරවැසියන්ට නිදහස් නිවහල් ජාතියක් අත්පත් කරදීම සඳහා දරණ වැයම අපි ප්‍රශංසාත්මකව අගය යුතුයි. රටේ අහිංසක ජනතාව බිල්ලට ගනිමින් වසර ගණනාවක් මේ රට විනාශ කළ රුදුරු ත්‍රස්තයන් පලවා හරිමින් රට මුදා ගන්නට තවදුරටත් එතුමා ඇතුළු ආරක්ෂක අංශයටත්, අපගේ විරෝධා රණවිරුවන්ටත්, ශක්තිය ධෛර්ය ප්‍රාර්ථනා කරන බව දැන්විය. අපගේ විරෝධාර රණවිරුවන් පුනරින් ජයග්‍රහණය කල බවත්,  එම ජයග්‍රහනය විශිෂ්ඨ ජයග්‍රහණයක් බවත්, සඳහන් කරන ලදී. මේ සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාට,හමුදාපතිතුමාට,ආරක්ෂක ලේකම්තුමාට හා ත්‍රිවිධ හමුදාවට බළන්ගොඩ නගර සභාවේ නාගරික ජනතාවගේ ප්‍රණාමය පුදකර සිටින බව වැඩිදුරටත් දැන්විය.

අතිගරු ජනාධිපතිතුමා විසින් 2009 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය මෙය ඉතා සාර්ථක අයවැයක් බවත්, මෙම අයවැයෙන් සහන රැසක් සලසා ඇති බවත්, එක්සත් ජතික පක්ෂය මෙම අයවැය විවේචනය කලද, විදේශ රටවල් ද මෙය සාර්ථක අයවැයක් ලෙස පිළිගෙන තිබෙන බව දැන්විය.

දෙහිගස්තලාව ප්‍රදේශයේ කුණු දැමීම සඳහා තබා තිබූ බැරල් 02 කින් එක් බැරලයක් ට්‍රැක්ටර් රථ රියදුරු විසින් රැගෙන විත් තිබෙන බවත්, එම නිසා එම ප්‍රදේශයේ ජනතාව මාර්ගයට කුණු දැමීම සිදුකරනු ලබන බවත්,මේ සම්බන්ධව අවධානයයොමු කර නැවත එම බැරලය එම ස්ථානයේ තැබීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිමින් සිය කථාව අවසන් කරන ලදී.

14. අවසානය:

<u>ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:</u>

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනිම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටත්, ලේකම් මහතාටත් සිය ස්තුතිය පුදකරමින්, ප.ව.01.45 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.